දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 02/2010

බ/12//02/අයවැය/2010
මුදල් අංශය,
බන්ධනාගාර මූලස්ථානය.
2010.01.05

සියළුම මාණ්ඩලික නිලධාරීන්.
සියළුම බන්ධනාගාර අධිකාරීවරුන්,
සහකාර බන්ධනාගාර අධිකාරීවරුන්,

<u>වාර්ෂික විසර්ජන ගිණුම සකස් කිරීම - 2009</u>

150 වන මුදල් රෙගුලාසිය හා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් ගේ අංක 206/2009 හා 2009.12.15 වන දිනැති චක්‍රලේඛය අනුව ගණන් දීමේ නිලධාරීන් හා ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් විසින් 2009 වර්ෂයට අදාල විසර්ජන ගිණුම පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු බව මා වෙත දන්වා ඇත.

02. 2009 වර්ෂයේ විසර්ජන ගිණුම පිළියෙල කිරීම සඳහා මේ සමඟ අමුණා ඇති පහත නම් සඳහන් ආකෘති පත්‍ර හා එහි සඳහන් උපදෙස් අනුව නිවැරදිව සකස් කර 2010.01.15 වන දිනට පෙර බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත ලබා දීමට අවශ්‍ය කටයුතු කරන මෙන් සියළුම මාණ්ඩලික නිලධාරීන්ට කාරුණිකව දන්වමි. වාර්ෂික විසර්ජන ගිණුමේ අඩුපාඩු හෝ වැරදි දත්ත ඇතුලත් වුවහොත් විගණකාධිපතිවරයා විසින් ඒ පිළිබඳව පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාව වෙත යොමු කිරීමට ඉඩ ඇති බැවින්, ඔබ ආයතනය විසින් ලබා දෙන තොරතුරු වල නිරවද්‍යතාවය ගැන ආයතන ප්‍රධානීන්ගේ පෞද්ගලික අවධානය යොමුවිය යුතු බව විශේෂයෙන් අවධාරණය කරමි.

03. බන්ධනාගාර මූලස්ථානයට අදාල විස්තර ලබා දීමේ දී අදාල අංශ වෙතින් (පාලන, සැපයුම්, ඉංජිනේරු, සුභ සාධක ) තොරතුරු ලබා දීමට අවශ්‍ය කටයුතු කිරීම අදාල සියළුම මාණ්ඩලික නිලධාරීන් විසින් පියවර ගත යුතුය.

04. බැරකම් ලේඛණයට ඇතුලත් නොකරන කිසිම බැරකමක් සඳහා 2010 වසරේ ප්‍රතිපාදනවලින් ගෙවීම් නොකිරීමට බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වග බලා ගත යුතුය.

05. විසර්ජන ගිණුම සකස් කිරීම සම්බන්ධව යම් පැහැදිලි කර ගැනීමක් වෙතොත් බන්ධනාගාර කොමසාරිස් (මුදල්), නියෝජ්‍ය කොමසාරිස් (මුදල්) හෝ සහකාර කොමසාරිස් (මුදල්) අමතන මෙන් වැඩි දුරටත් සඳහන් කරමි.

i. බැරකම් පිළිබඳ ප්‍රකාශය
ii. පාඩු හා අලාභ හානි පිළිබඳ ප්‍රකාශය
iii. ජංගම නොවන වත්කම් සංචලන වාර්තාව
iv. අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශය

මේජර් ජනරාල් වී.ආර්. සිල්වා
ආර්එස්පී, යූඑස්පී, එන්ඩියූ, අයිජී.
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

වී.ආර්. සිල්වා ආර්එස්පී යූඑස්පී එන්ඩියූ අයිජී
මේජර් ජෙනරාල්
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

පිටපත :- විගණකාධිපති

# බැරකම් පිළිබඳ ප්‍රකාශය (2009.12.31 දිනට නොගෙවූ හිඟ බිල්පත් විස්තර)

බන්ධනාගාර ආයතනයේ නම :-

| ණය හිමියාගේ නම * | වගකීම පිළිබඳ විස්තරය (සේවාව හෝ භාණ්ඩ මිලදී ගැනීම පිළිබඳ විස්තර) | අදාල වර්ෂය හා මාසය (අදාල භාණ්ඩය හෝ සේවාව ලබා ගත් මාසය) | වැය විෂය සංකේතය | මුදල (රු) |
|---|---|---|---|---|
| 01.අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු | | | | |
| i.......................... | | | | |
| ii.......................... | | | | |
| iii.......................... | | | | |
| 02. රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල | | | | |
| i.......................... | | | | |
| ii.......................... | | | | |
| iii.......................... | | | | |
| 03. පෞද්ගලික අංශය | | | | |
| i.......................... | | | | |
| ii.......................... | | | | |
| iii.......................... | | | | |

**උපදෙස්**

01. 2009 වර්ෂය තුලදී භාණ්ඩ මිලදී ගැනීම්/ සේවාවන් ලබා ගැනීම් සඳහා සැපයුම්කරුවන්ට, කොන්ත්‍රාත් කරුවන්ට, රජයේ හෝ පුද්ගලික ආයතන සඳහා ගෙවිය යුතු බිල්පත් 2009 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර ගෙවීමට නොහැකි වූයේ නම් එම සියළුම වියදම් 2009 වර්ෂයේ බැරකම් ලෙස ගිණුම් ගත කල යුතුය.

02. දුම්රිය, තැපැල්, දේශීය ආදායම් වැනි දෙපාර්තමේන්තු සඳහා ගෙවිය යුතු බිල්පත් හා බන්ධනාගාර කර්මාන්ත අංශයට ගෙවිය යුතු හිඟ බිල්පත් විස්තර අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු යටතේ ඇතුල් විය යුතුය.

03. පලාත් පාලන ආයතන, විදුලිබල මණ්ඩලය, ජල සම්පාදන මණ්ඩලය,සමුපාකාර, සතොස, රාජ්‍ය ඖෂධ සංස්ථාව ආදී ආයතන වලට ගෙවිය යුතු හිඟ බිල්පත් විස්තර රාජ්‍ය සංස්ථා හා ව්‍යාවස්ථාපිත මණ්ඩල යටතේ ඇතුලත් විය යුතුය.

04. පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන්, සැපයුම් කරුවන් හා පුද්ගලයන්ට ගෙවිය යුතු හිඟ බිල්පත් විස්තර/ බන්ධනාගාර නිලධාරීන්ට ගෙවීමට ඇති හිඟ අතිකාල හා ගමන් වියදම් විස්තර පෞද්ගලික අංශය යටතේ ඇතුලත් කල යුතුය. බන්ධනාගාර නිලධාරීන් සඳහා ගෙවීමට ඇති විස්තර නිලධාරීන්ගේ නම් වශයෙන් ඉදිරිපත් නොකර වැය විෂය හා අදාල මාසය අනුව සාරාංශයක් ඉදිරිපත් කරන්න.

05. මු.රෙ. 115 යටතේ අනුමැතිය ලබාගත් හා අනුමැතිය ලබා ගැනීමට නියමිත ගෙවීම් ද ඇතුලත් කල යුතුය.

06. 2009 වර්ෂයට පෙර වර්ෂ වලට අදාලව රාජ්‍ය හෝ පුද්ගලික අංශයට නිරවුල් නොකරන ලද හිඟ බිල්පත් ඇත්නම් ඒවාද ඇතුලත් කල යුතුය.

07. අදාල කොන්ත්‍රාත්කරුවන්,සැපයුම්කරුවන් , රජයේ හා පුද්ගලික ආයතන වලින් අදාල බිල්පත් විස්තර කඩිනමින් ගෙන්වා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඔවුන්ට ලිඛිතව දැනුම් දීමට කටයුතු කල යුතුය.

08. අත්තිකාරම් හා පොදු තැන්පත් ගිණුම යටතේ ඇති බැරකම් මීට ඇතුලත් නොකළ යුතුය.

# පාඩු හා අලාභ හානි පිළිබඳ ප්‍රකාශය -2009

බන්ධනාගාර ආයතනයේ නම :-

| අනු අංකය | අලාභයේ/පාඩුවේ/අනතුරේ ස්වභාවය විස්තර කරන්න. (වාහන අනතුරක් නම් වාහන අංකය හා වර්ගයද සඳහන් කරන්න) | සිද්ධිය වූ දිනය | අලාභයේ/පාඩුවේ ඇස්තමේන්තු වටිනාකම (රු) | රක්ෂණය හෝ වෙනත් ක්‍රමයකින් අයකර ගත හැකි මුදල | කපා හැරීමට හෝ අත් හැරීමට ඇති වටිනාකම | බන්ධනාගාර මූලස්ථානයට මේ පිළිබඳව දන්වා තිබේද? |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

උපදෙස්

01. 2009 වර්ෂය තුළ සිදුවීම් පමණක් ඇතුලත් කරන්න.

02. අදාල කාලය තුළ අලාභයක් අනතුරක් සිදුවීම් නොමැති නම් හිස් වාර්තාවක් ඉදිරිපත් කරන්න.

# අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශය - 2009

බන්ධනාගාර ආයතනයේ නම :-

| දිනය | වවුචර් අංකය | ආදායකයාගේ නම | ගණන (රු) |
|---|---|---|---|
| | | | |

උපදෙස්

01. 2009 වර්ෂයට අදාල සියළුම ගෙවීම් වවුචර කඩිනමින් විගණනය සඳහා ඉදිරිපත් කල යුතුය. කිසියම් හේතුවක් නිසා එසේ ඉදිරිපත් කිරීමට නොහැකි වවුචර තිබේ නම් ඒ පිළිබඳව විස්තර ඇතුලත් විය යුතුය.

02. අස්ථානගත වවුචර නොමැති නම් හිස් වාර්තාවක් ඉදිරිපත් කරන්න.

## ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාව - 2009

බත්ධනාගාර ආයතනයේ නම :-

| වැය විෂය හා වත්කම් කාණ්ඩය | | මිලදීගත් අත්පත් කර ගත් වත්කමේ නම | 2009.01.01 දිනට ආරම්භක ශේෂය | 2009 වර්ෂය තුල එකතු කිරීම් | 2009 වර්ෂය තුල අපහරණය | 2009.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| | | | රු. | රු. | රු. | රු. |
| 2101 | වාහන මිලදී ගැනීම් | | | | | |
| 2102 | කාර්යාලීය උපකරණ හා ගෘහ භාණ්ඩ | | | | | |
| 2103 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | | | | | |
| 2104 | නව ගොඩනැගිලි ඉදි කිරීම් | | | | | |

උපදෙස්.

01. 2004/01/01 දිනෙන් පසුව වැය විෂයන් වල ප්‍රතිපාදන මඟින් අත්පත් කරගත් හෝ මිලදී ගත් වත්කම් පමණක් ඇතුලත් කල යුතුය. එනම් 2009.01.01 දිනට ආරම්භක ශේෂය වනුයේ 2004.01.01 දින සිට 2008.12.31 දින දක්වා මිලදී ගත් වත්කම් වලින් අදාල කාලය තුල අපහරණය කරන ලද වත්කම් අඩු කිරීමෙන් පසු ශේෂයයි. ස්ථාවර වත්කම් ලේඛණය අනුව තිවරදි විය යුතුය.

02. 2009 වර්ෂය තුලදී මිලදී ගත් වත්කම් ඒ ඒ වැය විෂය අනුව සඳහන් කල යුතුය. එම වත්කම්වල වටිනාකම අදාල වැය විෂයේ වර්ෂය තුල කරන ලද මුළු වියදමට සමාන විය යුතුය. (වැය ලෙජරය වියදම හා සමාන විය යුතුය.) බන්ධනාගාර මුලස්ථානය මඟින් මිලදී ගෙන බන්ධනාගාර ආයතනවලට ලබා දුන් වත්කම් පිළිබඳ විස්තර බන්ධනාගාර ආයතන යටතේ ඇතුලත් නොකල යුතුය. එවැනි මිලදී ගැනීම් විස්තර බන්ධනාගාර මුලස්ථානයේ සැපයුම් අංශය හා ඉංජිනේරු අංශය විසින් ලබා දිය යුතුය. (2009 වර්ෂයට අදාල මිලදී ගැනීම් සඳහා පමණයි.)

04. 2009 වර්ෂය තුල අපහරණය කරන ලද වත්කම් පිළිබඳ තොරතුරු ඇතුලත් කිරීමේ දී 2004.01.01 දිනෙන් පසුව මිලදී ගත් හෝ අත්පත් කර ගත් වත්කම්වලට අදාලව අපහරණය කිරීම් පිළිබඳව තොරතුරු පමණක් ඇතුලත් කල යුතුය.